www.monlib.vic.gov.au

# අන්තර්ජාලය හඳුන්වාදීම

## හඳුන්වාදීම

එකිනෙකා සමග සංනිවේදනයක් ඇති කිරීම සඳහා ලෝකයේ රටින් රට පිහිටි පරිගනක යන්ත්‍ර එකින් එක සම්බන්ධ කරන්නේ අන්තර ජාලයයි. වර්ල්ඩ් වයිඩ් වෙබ්, වෙබ් පේජස් නමැති අන්තර ජාලයේ පිහිටුවා ඇති එක්නෙකට සම්බන්ධ තාවයක් ඇති ලේඛන ගොන්නකි. එය www හෝ “The Web” වශයෙන් හැඳින්වේ.




## මවුසයක් පාවිච්චි කිරීම

මවුසයේ වම් බොත්තම උඩ අබරැගිල්ල රැදෙන පරිදි ඔබේ අත්ලයෙන් මවුසය අල්ලා ගන්න.



වමත හුරු.



දකුනත හුරු

# ඔබේ පරිගණක තිරය




මවිසයේ ඊතලය අත සළකුණට හැරුනුවිට ඒ උඩ ක්ලික් කල හැක. එය වෙනත් පිටුවකට සම්බන්ධ කිරීමකි. එය මතක තබා ගැනීම වැදගත්.

**තිරයේ ඇති වැදගත් බොත්තම් සමහරක් නම්**

**ආපස්සට** - පෙර තීරයට ගෙන යනු ලබයි.

**ඉදිරියට** - ඊලග තීරයට ගෙන යනු ලබයි.

**නැවත ගොඩනගා ගැනීම** - අඩවිය නැවත ගොඩනගා ගැනීම.

**හෝම් පේජය** - හෝම් පේජය ට ආපසු ගෙන යයි.

**නැවතීම** - සෙවුම නවතී.

තිරයේ දකුණු පස පිහිටා ඇති **උඩට පහලට රෝල් කරන තීරය** ඔබගේ මවුසයෙන් තිරය උඩට පහලට රෝල් කිරීමට යොදා ගත හැක,

**ප්‍රියතම** - ඔබේ ප්‍රියතම වෙබ් අඩවි වල ලිපිනයන් ගබඩා කර තැබිය හැකි අතර අවශ්‍යවූ විටකදී මවුසය ක්ලික් කිරීමෙන් තිරයේ පහතට වැටෙන ලයිස්තුවෙන් ඕනෑම එකක් තෝරා ගත හැක.

# අන්තර්ජාල ලිපිනයන්

සෑම අන්තර ජාල අඩවියකටම ලිපිනයක් තිබේ. මේ සඳහා වෙබය **URLs** (Uniform Resource Locators) යොදා ගනී.

උදාහරණයක් වශයෙන **www.whitepages.com.au**

**www** - මෙයින් හඳුන් වන්නේ එය වර්ලිඩ් වයිඩ් වෙබ් (World Wide Web) යනුවෙනි.

**whitepages** - හිමිකරු. කාගේ පරිගනයට ඔබ සම්බන්දවී ඇත්දැයි දැන ගත හැක.

**com** - ආයතන නාමය

පොදුවේ යොදනු ලබන සමහර ආයතන වර්ග නම්:

**com** හෝ **co** (එක්සත් රාජධානිය) වානිජ ආයතන

**gov** - රජයේ ආයතන

**mil** - හමුදාමය ආයතන

**org** - ලාබ නොලබය ආයතන

**net** - ජාල ආයතන

**edu** හෝ **ac** - අධ්‍යපන සහ ශාස්ත්‍රීය ආයතන

**au** - මෙය රටක් හඳුනා ගැනීමට යොදා ගනු ලබන සංකේතය. au යන්න ඔස්ට්‍රේලියාව. එක්සත් ජනපදය සාමාන්‍යයෙන් රටක් හැඳින්වීමේ සංකේතය යොදන්නේ නැත.

***අභ්‍යාස:***

මෙම තොරතුරු සිතෙහි තබාගෙන පහත සඳහන් දෑ සඳහා වන URL මොනවාද?

- ලාබ නොලබන ඔස්ට්‍රේලියානු ආයතනය RSPCA
- මොනෑස් කවුන්සලය
- ඔස්ට්‍රේලියානු වානිජ ආයතනය වන Telstra

# ඔබ අන්තර් ජාල ලිපිනය දන්නා විට අඩවියකට සම්බන්ධ කර ගන්නා ආකාරය

ඔබ වෙබ් අඩවියක ලිපිනය දන්නා විට එය සම්බන්ධ කර ගැනීම සරලයි. එය මෙසේය:

1. තිරයේ ඉහල ඇති ලිපිනය කොටුව එක් වරක් ක්ලික් කරන්න. (මෙය දිග සුදු පාට සෘජුකෝණාශ්‍ර කොටුවකි). මෙසේ කිරීමෙන් අදාතන කොටුව ඉස්මතු කර පෙන්නා දෙයි.

2. ඒ මතුපිට නව ලිපිනය ටයිප් කරන්න.

3. සෙවුම සඳහා එන්ටර්/රිටර්න් යතුර ඔබන්න

*අඩපස:*
පහත සඳහන් අඩවි වටා මවුසය එහා මෙහා ගෙන යෑමේදී ඊතලය අතක් බවට හැරේ. මෙයින් සංකේතවත් වන්නේ සම්බන්ධයකි. යෝජනා කර ඇති පහත සඳහන් එවා හෝ තමාට කැමති එකක් ක්ලික් කරන්න.

**පිරික්සා බැලීම සඳහා ලිපිනයන්:**

www.openroad.vic.gov.au/
ඔබේ මව් භාෂාවෙන් තොරතුරක් ඇත්දැයි බලන්න

www.visitvictoria.com.au
"Events" යන්න ක්ලික් කර කිනම් ක්‍රීඩා සිදුවීම් ඇත්දැයි බලන්න.

www.onlinenewspapers.com
සිත් ගන්නා ප්‍රවෘති පත්තරයක් තෝරා ගන්න.

www.burkesbackyard.com.au
නවතම දර්ශනයකින් තතු වාර්තාවක් සාදන්න

www.wishlist.com.au
මිතුරකුට ප්‍රසන්න උපන්දින තෑග්ගක් සොයන්න